**දඹුල්ල මහා නගර සභාව.**

**-------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**----------------------**

**1 මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 25 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින දඹුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

**1.2 මතය**

**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**-------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

**---------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් ගබඩා අත්තිකාරම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව වර්ෂ අවසානයට ගබඩා ලෙජරයේ පැවති ශේෂය ගිණුම් ගත කර තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සමග ඉකුත් වර්ෂයේ සංඛ්‍යා සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

**------------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.146,345 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 36 ක් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.5,031,655 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) පහල වැව සිට කණ්ඩලම පාර දක්වා මාර්ගය බොරළු ඇතිරීමේ කර්මාන්තයේ රු.25,000 ක අතරුදවුම් මුදල කර්මාන්ත ණයහිමි යටතේ මෙන්ම තැන්පත් ගිණුම යටතේ ද දක්වා තිබුණි.

(ඇ) ජ'නල් සටහන් වලට අදාලව වවුවර්පත් පිළියෙල කර නොතිබුණු අතර, ජ'නල් සටහන් ඇතුළත් කල ලේඛනයක්ද පිළියෙල කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල රු.460,880 කට මිලදී ගෙන තිබුණු ත්‍රීවීල් රථයේ වටිනාකම මෝටර් රථ හා රථ වාහන යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්.**

-----------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.5,797,221 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.178,577 ක ශුද්ධ සෘණ අගයක් නිරීක්ෂණය විය.

**1.3.4 විගණනය සදහා සාක්ෂි නොවීම.**

--------------------------------------

ගිණුම් විෂයන් 06 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.290,919,207 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**2. මූල්‍ය සමාලෝචනය.**

--------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය.**

------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ වියදම ඉක්ම වූ පුනරාවර්ථන ආදායම රු.10,969,900 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.18,320,559 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.29,290,459 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

------------------------

**2.2.1. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය.**

------------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වරිපනම් හා බදු කුලී.**

-----------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබූ හිඟ ශේෂය සහ වර්ෂය තුළ බිල්කළ වරිපනම් බදු වල එකතුව රු.7,825,576 ක් වුවත් වර්ෂය තුළ අය කර තිබුණේ ඉන් සියයට 48

ක් හෙවත් රු.374,177 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ මුදල රු.4,079,369 ක අගයක් ගෙන තිබුණි.

**(ආ) කඩකුලී.**

**----------**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට කඩකුලී ශේෂය රු.38.545,940 ක් වූ අතර වර්ෂය තුළ බිල්කිරීම් සමඟ අයවිය යුතු මුළු මුදල රු.44,301,323 ක් වුවත් වර්ෂය තුළ අයකර තිබුණේ ඉන් සියයට 11 හෙවත් රු.4,828,400 ක් පමණි. ඒ අනුව වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ මුදල රු.39,472,923 ක් තරම් ඉහල අගයක් ගෙන තිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**--------------------------------**

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,274,165 ක් හා මුද්දර ගාස්තු ලෙස රු.5,627,210 ක් අයවිය යුතුව තිබුණි.

**2.2.3 වෙනත් ආදායම්**

**---------------------**

**පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ (අති විශේෂ ) ‘‘ඇ‘‘ කොටසේ 4:2 අනුව පරිසර බලපත්‍ර වලංගු කාලය වසර තුන ඉක්මවීමට ප්‍රථම මාස තුනකට කලින් එය යාවත්කාලීන කල යුතු වුවත් ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා රු.92,000ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) යොමු ගත ගැසට් පත්‍රයේ ‘‘ඇ‘‘ කොටසේ 1:3:2 අනුව පරික්ෂා කිරීමේ ගාස්තු ඇතුළු පාරසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදයේ ක්‍රියාකරකම් සඳහා අයකරනු ලබන ගාස්තු සඳහා වෙනම අය ශීර්ෂයක් පවත්වා ගත යුතු වුවත් මහා නගර සභාව විසින් එසේ කටයුතු නොකිරීම හේතුවෙන් පාරසරික අරක්ෂණ බලපත්‍ර සම්බන්ධයෙන් වූ ආදායම් නිශ්චිත වශයෙන් කොපමණදැයි ගණනය කිරීමට අපහසු වී තිබුණි.

(ඇ) සභාවට අයත් නාගරික ශාලා දෙක ගාස්තු අය කිරීමකින් තොරව බාහිර පාර්ශවයන් වෙත ලබා දීම නිසා 2013 වර්ෂයේදී රු.12,260ක ආදායමක් අහිමි වි තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය.**

**-------------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**---------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) සභාව විසින් භාවිතයට යොදවා ගෙන ඇති වාහන 16 ක අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණු අතර එම වාහන සඳහා වාර්ෂික බලපත්‍ර සහ ඉන් වාහන 12 කට වාර්ෂික රක්ෂණාවරණයද ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නගරාධිපති නිල වාහනය සඳහා ඉන්ධන සීමාවන් මහා සභාව විසින් තීරණය කර නොතිබුණි.

(ඇ) 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත අනුව සභාව බද්ධට යටත් සැපයුම් වල කාර්තුමය වටිනාකම රු.3,000,000 ඉක්මවන්නේ නම් හෝ බද්ධට යටත් සැපයුම් වල වාර්ෂික වටිනාකම රු.12,000,000 ක් ඉක්මවන්නේ නම් එකතු කළ අගය මත බදු ගෙවිය යුතු වුවද නගර සභාව එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

(ඈ) සම්මත අතුරු ව්‍යවස්ථාවේ 90/ඒ පිටුවේ 11 කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ විධිවිධාන සහ 2013 මාර්තු 01 දින පල කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව අයකළ යුතු මුදලට වඩා රු.1,162,000 ක් අඩුවෙන් අයකර ඇති බව දක්නට ලැබුණි.

(ඉ) මහා සභා අනුමැතියක් ලබා නොගෙන 2013 ජූනි 19 වන දින පැවති සාම පා ගමන සඳහා සහභාගි වූ 30 දෙනෙකු සඳහා දහවල් හා රාත්‍රී ආහාර සැකසීම සඳහා රු.10,500ක වියදම් දරා තිබිණි.

(ඊ) මහා නගර සභා සේවකයන්ට විවිධ කාර්යයන් සඳහා විවිධ දීමනා ගෙවීම සඳහා මධ්‍යම පලාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.28,932 ක දීමනා ගෙවා තිබුණි.

**3.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්.**

-----------------------------------------------

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබුණු වාහන 02 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමණාකරනය.**

--------------------------------------

සභා බල ප්‍රාදේශයට අයත් කසල, සභාවේ ට්‍රැක්ටර් තුනක් සහ සේවකයන් යොදා දිගම්පතහ ප්‍රාදේශයේ රජයේ ඉඩමකට බැහැර කරන අතර මේ සම්බන්ධව විවිධ ගැටළු පැනනැගී ඇති බවත් සභාව විසින් කසල ප්‍රතිචක්‍රීකරන වැඩ සටහන් සඳහා අවධානය යොමුකොට නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

**පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) කාර්මික නිලධාරීන් විසින් අදාල කර්මාන්තය පිළිබඳව නිසි ලෙස අධ්‍යනය කර මිනුම් වාර්තා ලබා ගෙන ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා 2013 වර්ෂයේ ඉටු

කරන ලද කර්මාන්ත වල වැඩ විෂයන් සඳහා අධි සහ ඌන ඇස්තමේන්තු සකසා තිබුණි.

(ආ) සභාවේ වැඩ අධිකාරී සහ කාර්මික නිලධාරී විසින් මාර්ග නිසි ලෙස නොහඳුනන බවත් අදාල කර්මාන්තයේ ආරම්භය හා අවසානය පැහැදිලිව පෙන්වීමට නොහැකි වූ බවත්, සමහර කර්මාන්ත පිළිබඳ තොරතුරු කොන්තාත්කරුගෙන් පවා විමසීමට සිදුවූ බවත් එය ඉතාමත් බැරෑරුම් තත්වයක් බවත් ස්ථානීය පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත කිහිපයක් ඉටු කර තිබුණත් එම කර්මාන්ත වල නිවැරදි මිනුම් වාර්තා සකස් කර නොතිබුණු අතර වැඩ බිමට නිකුත් කරන ලද ද්‍රව්‍ය පිළිබඳ විස්තර ඇතත් ඉතිරි භාණ්ඩ ආපසු ගබඩාවට භාරදුන් අවස්ථා දක්නට නොලැබුණු අතර ශ්‍රමය සඳහා අදාල කර්මාන්තයට ගෙවන ලද චෙක්රෝල් ගොනු කර නොතිබුණි.

## 4 ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය.

---------------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය.

----------------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133(1) සහ (2) රෙගුලාසි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ වැය විෂයයක් සඳහා වූ රු.8,891,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වි තිබුණු අතර, තවත් වැය විෂයයක් සඳහා වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දරා තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මුල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන.

----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අභ්‍යන්තර විගණනය.
(ඇ) අයවැය පාලනය.
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ඉන්වෙන්ට්‍රි පාලනය.